## 3.16 මධ්‍ය ලක්ෂ්‍ය ප්‍රමේය ගොඩනැගීමට /සත්‍යාපනයට උචිත ගණිත උපකරණයක් නිමවුම හා භාවිතය

(අ) පෙර දැනුම

i. පාදවල මධ්‍ය ලක්ෂ්‍ය හඳුනා ගැනීම
ii. සමාන්තරාස්‍රවල මූලික ගුණ

(ආ) උපකරණය සහ එහි උපාංග




උපාංග




උපකරණය

(ඇ) උපකරණ නිමවුමට කාර්යය පත්‍රිකාව

i. වර්ණ $A^4$ කඩදාසියක PQR ත්‍රිකෝණයක් ඇඳ එහි PQ හා PR පාදවල මධ්‍ය ලක්ෂ්‍ය (X,Y) ලකුණු කර ඝන කාඩ්බෝඩ් එකක අලවා ගන්න.
ii. XQ=XW=YZවන සේ WXYZ සමාන්තරාස්‍රය X-RAY පටි කැබලි හතරකින් සකසා ගන්න.
iii. XY =WT වන සේ X-RAY පටියකින් WT සකසා ගන්න.
iv. PX=XB, XY=XA, AB=PY වන සේ (PXY $\Delta \equiv$ AXB$\Delta$)ලෙස ත්‍රිකෝණයක් කඩදාසියකින් ඇමුණුම් වාසිද සමග කපා ගන්න.
v. ඉහත උපාංගවල සෑම එකක්ම X,Y,W,Z,A,B ලක්ෂ්‍ය හරහා සිදුරු විද උපකරණයේ පරිදි අසව් කර ගන්න.

(ඈ) උපකරණ භාවිතයට කාර්යය පත්‍රිකාව

i. AXB$\Delta$ මගින් PQ මධ්‍ය ලක්ෂ්‍ය X බව නිරීක්ෂණය කරන්න.
ii. WZ=WT වූ WT මගින් QR දිග අනුමාන කර ගන්න.
iii. WXYZසමාන්තරාස්‍රය මගින් XY හා QR අතර සම්බන්ධතා විමසන්න.
iv. අදාළ ජ්‍යාමිතික ප්‍රමේයය ගොඩනගන්න.